**නෙදර්ලන්තයට සමාජගතවීම සඳහා**

නෙදර්ලන්තයේදී පවත්වනු ලබන විභාගයකින් ඔබ සමත්විය යුතුය.

නෙදර්ලන්ත සමාජයට අනුගත කරගැනීම සඳහා පවත්වනු ලබන විභාගයකි ඒ. මේ විභාගය මූලික විභාගයට වඩා අමාරුය. ඔබ ඕලන්ද භාෂාව හොඳින් ඉගෙනියයුත්තේ මේ නිසාය. එමෙන්ම නෙදර්ලන්තය ගැන බොහෝ දේ උගත හැකිය. එබැවින් ඔබට නෙදර්ලන්ත සමාජයට අනුගත විය හැක. එමෙන්ම ඔබට වැඩකිරීමේ අවස්ථා බොහොමයක්ද ලැබෙනු ඇත.

විභාගය කොටස් හයකින් යුක්ත වේ.

1. කියවීමේ හැකියා ප්‍රමාණය - ඕලන්ද භාෂාව කියවීමේ හැකියාව ඔබට තිබිය යුතුය.
2. ඇහුම්කන්දීමේ හැකියාවේ ප්‍රමාණය - ඔබට ඕලන්ද භාෂාව තේරුම්ගැනීමේ හැකියාව තිබිය යුතුය.
3. ලිවීමේ හැකියාවේ ප්‍රමාණය - ඔබට ඕලන්ද භාෂාව ලිවීමේ හැකියාව තිබිය යුතුය.
4. කතාකිරීමේ හැකියාවේ ප්‍රමාණය - ඔබට ඕලන්ද භාෂාව කතාකිරීමේ හැකියාව තිබිය යුතුය.
5. නෙදර්ලන්ත සමාජ ජීවිතය පිළිබඳ අවබෝධයක් - නෙදර්ලන්තයේදී ඔබ එකිනෙකා සමග පැවතිය යුත්තේ කෙසේදැයි ඔබ දැන සිටිය යුතුය.
6. නෙදර්ලන්ත රැකියා වෙළඳපොළ තුළ ඔබ රැඳී සිටිය යුතුය - රැකියාවක් සොයා ගැනීමේ හැකියාව ඔබට තිබිය යුතුය

මේ විභාගය කෙසේ පවත්වන්නේද?

1. කියවීමේ හැකියියේ ප්‍රමාණය

විභාගයට ඔබ පරිගණකය භාවිතා කරන්න. ඔබ අන්තර්ගතය කියවන්න. උදාහරණයක් වශයෙන් අන්තර්ගතය ප්‍රවෘත්ති පත්තරේකින් විය හැක. හැම අන්තර්ගතයකින්ම ඔබට ප්‍රශ්ණ ස්වල්පයක් ලැබෙනු ඇත. මේ ප්‍රශ්ණවලට බොහෝ පිළිතුරු ඔබට දැකගත හැකිවේ.

2. සවන්දීමේ හැකියාවේ ප්‍රමාණය

විභාගයේදී ඔබ පරිගණකය භාවිතා කරන්න. ඔබට චිත්‍රපට දෙස බැලීමට සිදුවේ. ඔබ අන්තර්ගතයට ඇහුම්කන් දෙන්න. සෑම චිත්‍රපටයකින්ම ඔබට ප්‍රශ්ණ ස්වල්පයක් ලැබෙනු ඇත. ප්‍රශ්ණ රැසකට ඔබට පිළිතුරු බලාගත හැකිවේ. ඔබ නිවැරදි පිළිතුර තෝරාගන්න.

3. ලිවීමේ හැකියාවේ ප්‍රමාණය

විභාග පත්තරේම ලියන්න. ඔබට විවිධ මාදිලියේ අභ්‍යාස ලැබෙනු ඇත.

උදාහරණයක් වශයෙන්,

- ඔබ ලියුමක් ලියනු ඇත.
- පෝරමයක් පුරවනු ඇත.
- වාක්‍යය සම්පූර්ණ කිරීමට සිදුවනු ඇත.
- මිතුරෙකුගේ උපන්දිනයට ඊ-මේල් පණිවිඩයක් ලීවීමට ඔබට සිදුවේ.
- රැකියා මධ්‍යස්ථානයකට යැවීම සඳහා පෝරමයක් පිරවීමට ඔබට සිදුවනු ඇත.

4. කතාකිරීමේ හැකියාවේ ප්‍රමාණය

විභාගයේදී ඔබ පරිගණකය භාවිතා කරන්න. විභාගය කොටස් දෙකකින් ඔබට ප්‍රශ්ණ ලැබෙනු ඇත.

1. නිවැරදි උත්තරය පරිගණකයෙන් කියවන්න.
2. චිත්‍රපට බලන්න, ඇහුම්කන් දෙන්න. බොහෝ උත්තර ඔබට දැකගතහැකිය. නිවැරදි පිළිතුරු තෝරන්න.

5. ඕලන්ද සමාජය පිළිබඳ අවබෝධය.

විභාගයේදී පරිගණකය භාවිතා කරන්න. චිත්‍රපට බලා ඇහුම්කන් දෙන්න. සෑම චිත්‍රපටයකින්ම ප්‍රශ්ණ ස්වල්පයක් ඔබට ලැබෙනු ඇත. නිවැරදි පිළිතුරු ගණනාවක් ඔබට දැකගත හැක. නිවැරදි පිළිතුර ඔබම තෝරාගන්න.

6. නෙදර්ලන්ත රැකියා වොළඳපොළේ රැඳී සිටිය යුතුවේ.

මෙම විභාගය කොටස් දෙකකින් යුක්තය.

1. ඔබ ඔබේම ලිපිගොනුවක් සකස්කර ගන්න. උදාහරණයක් වශයෙන් එහි ඔබට කළ හැකිදේ ලියා තබන්න. දැන් ඔබට කළ හැකි සහ ඉදිරියට කළ හැකි වැඩ ලියා තබන්න. අප ඊට ලිපිගොනු කවර යැයි කියන්නෙමු. මූලික සේවක ගණය (Carder) දෙස බලන්න.

ඔබගේ ලිපිගොනුව විමසා බලන්න. ඔබේ ලිපිගොනුව පිළිගත හැකිද? එසේ ඔබගේ සම්මුඛ පරීක්ෂණය ඔබ විසින්ම ලබාගන්න. එම සම්මුඛ පරීක්ෂණය ඔබේ ලිපිගොනුව පිළිබඳවයි.

ඔබ විසින්ම විභාගයට සංවිධාන වන බවක් ඔබට පෙනී යනු ඇත.

ඔබ තනිවම අධ්‍යන කටයුතු කරගෙන යායුතුයි. මේ සඳහා ඔබම ඒකීකරණ විභාගයෙන් සමත්වීමට ඔබට බොහෝ අවස්ථා සැළසෙනු ඇත. නමුත් ඒකීකරණ පාඩම් මාලාවක් ඔබ උගත යුතුමයැයි ඉන් හැගෙන්නේ නැත.

ඔබ ඒකීකරණ පාඩම් මාලාවක් උගත යුතුමද? එසේ නම් www.lkwilinburgeren.nl වෙබ් අඩවිය බලන්න.

පාඩම් මාලාව සහ විභාගය සඳහා ඔබේ මුදලෙන් ගෙවියයුතු වේ.

ඔබට ගෙවිය නොහැකිද? විභාගය සහ පාඩම් මාලාව සඳහා ඔබට ණය ලබාගත හැක. DUO එකෙන් ඔබට ණය ලබාගත හැක. පසුව මේ මුදල් ඔබ විසින් ආපසු ගෙවිය යුතුව තිබේ. පොලියක් ද ගෙවීමට ඇත.

**ලිපිගොනුවක් ඇයි?**

රැකියාවක් සොයාගැනීමත්, රැකියාවේ රැඳී සිටීමත් අමාරු කරුණකි.

ඔබ ලිපිගොනුවක් සකස් කර ගන්නේ ඒ නිසාමය. ඔබට කළ හැකි වැඩ පිළිබඳ තොරතුරු මෙහි තිබේ. 2015 ජනවාරි 01 වෙනිදා හෝ ඊට පසු දිනක හෝ ඔබ පදිංචි සහතිකය ලබාගන්න. එවිට 2015 ජනවාරි 1 වෙනිදා සිට ලිපිගොනුව විභාගය සඳහා පිළිගනු ලැබේ. මෙය රැකියා වෙළඳපොළ සඳහා සැකසුනු කොටසකි. තවදුරටත් දැනගතයුතු දේ තිබේනම් www.lkwilinburgeren.nl වෙබ් අඩවියට යන්න.

ඔබේ ලිපිගොනුවෙහි තිබෙන්නේ මොනවාද?

ඔබේ ලිපිගොනුවේ පෙනෙන්ට තිබෙන්නේ පත්‍රයි. ප්‍රතිඵල ලේඛන. ඔබම මේ පත්‍රවල ලියන්න.

- ඔබට උවමනා කරන වැඩය ගැන සොයා බලන්න. ඔබට කරන්න ඕනෑ කරන වැඩය ලියන්න.
- ඔබට කළ හැකි වැඩ කුමක්දැයි සොයා බලන්න. ඔබට කළහැකි වැඩය ලියා තබන්න.
- දැනට තිබෙන වැඩ මොනවාදැයි සොයා බලන්න. දැනට තිබෙන වැඩ ලියා තබන්න.
- ඕලන්ද ජාතිකයින් වැඩ කරන ආකාරය ඉගෙන ගන්න. නෙදර්ලන්තයේදී වැඩකරන ආකාරයට ඔබද වෙනස් වන්නේ කෙසේදැයි බලන්න. ඔබ වෙනස් වන ආකාරය ලියා තබන්න.
- පසුවට ඔබට කළහැකි වැඩ මොනවාදැයි සොයා බලන්න. සැළසුමක් සාදා ගන්න. වැඩ සැලසුම් දිගටම කරගෙන යන්න.